018

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය.
සමාජ අධ්‍යයන අංශය
තරුණ කටයුතු පිළිබඳ උසස් ඩිප්ලෝමාව - 04 වන මට්ටම
අවසාන පරීක්ෂණය - දෙවන අර්ධ වර්ෂය 2024/2025
**DSD4207- තාරුණ්‍යය සහ සෞඛ්‍යය**

කාලය: පැය 02යි.

දිනය: **02/08/2025** වේලාව: ප.ව. 1.30 - ප.ව. 3.30

උපදෙස්

- ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.
- එක් ප්‍රශ්නයකට ලකුණු විසි පහක් (25) හිමි වේ.
- පැහැදිලි අත් අකුරු අපේක්ෂා කෙරේ.

01. 1.1. ශ්‍රී ලංකාවේ නව යොවුන් වියේ පසුවන්නන්ට සහ තාරුණ්‍යයට බලපාන ප්‍රධාන සෞඛ්‍ය ගැටළු අවම වශයෙන් හයක් ලැයිස්තුගත කරන්න. (ල.12)

1.2. ඉහත ප්‍රශ්න අංක 1.1 හි දක්වා ඇති සෞඛ්‍ය ගැටළු ආමන්ත්‍රණය කිරීම සඳහා භාවිතා කරනු ලබන ආයතනයන් සහ වැළැක්වීමේ උපායමාර්ග වල (Preventive Strategies) ස්වභාවය විස්තර කරන්න. (ල.13)

02. 2.1. "සෞඛ්‍යය" (Health) යන පදය නිර්වචනය කරන්න. (ල.5)

2.2. "අසනීප නොවී රෝගයක් ඇති විය හැකිය. නිදසුනක් වශයෙන්, හෘද රෝග ඇති පුද්ගලයෙකුට හෘදයාබාධයක් ඇති වන තුරු ඔහුට/ඇයට හෘද රෝගයක් ඇති බව නොදැන සිටිය හැකිය" . මෙම සන්දර්භය තුළ තාරුණ්‍යය පිරිස්ගේ සෞඛ්‍යය සහතික කිරීම සඳහා තාරුණ්‍ය වෘත්තිකයෙකුගේ (Youth Worker ) භූමිකාව පිළිබඳව සාකච්ඡා කරන්න. (ල.20)

03. "තරුණ, රැකියා විරහිත පුද්ගලයින් මත්ද්‍රව්‍ය විකිණීම වැනි අපරාධ ක්‍රියාකාරකම්වලට ඇද දමනු ලබන අතර, ඔවුන්ට ඇති සියලුම සෞඛ්‍ය අවදානම් ඔවුන් ඉතා හොඳින් දැන සිටී.
තරුණයින් මෙයට සම්බන්ධ වන්නේ ජීවත්වෙන මාර්ගයක් ලෙස පමණක් නොව, ඔවුන් බඳවා ගත් කණ්ඩායම් හෝ සමූහ සමඟ ඔවුන්ට අරමුණක් සහ අයිතිවාසිකම් පිළිබඳ හැඟීමක් ලබා දිය හැකි බැවිනි. එවැනි අවස්ථාවන්හිදී එය මත්ද්‍රව්‍ය භාවිතා කිරීම සහ විකිණීම තත්ව සංකේතයක් (Status Symbol )බවට පත්විය හැකිය''.
ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍යවල සමකාලීන ව්‍යාප්තිය සහ රාජ්‍ය අංශය (Government Sector) සහ රාජ්‍ය නොවන සංවිධාන අංශය (NGOs sector) විසින් හඳුන්වා දී ඇති වැළැක්වීමේ උපායමාර්ග (Preventive Strategies) සාකච්ඡා කරන්න. (ල.25)

04."නිවාරණ සෞඛ්‍යය (Preventive Health) දිගු කාලීනව සුව කිරීමේ සෞඛ්‍යයට වඩා සැලකිය යුතු ලෙස ලාභදායී වේ; එබැවින්, වැළැක්වීමේ සෞඛ්‍ය උපායමාර්ග (Preventive Health Strategies) විශිෂ්ට සමාජ ආයෝජන උපායමාර්ග වේ (Social Investment Strategies) ".
සෞඛ්‍ය ගැටළු වෙත විශේෂ අවධානයක් යොමු කරමින්, සෞඛ්‍යය ආර්ථික සංවර්ධනයට කෙසේ සම්බන්ධ සම්බන්ධ වන ආකාරය සාකච්ඡා කරන්න. (ල.25)

05. සෞඛ්‍යය හා සම්බන්ධ අවශ්‍යතා නිර්වචනය කරන සාධක, භෞතික (**Physical Development)** හා මානසික මානයන් (**Phycological Changers**) යටතේ පුළුල් ලෙස වර්ග කළ හැක.

5.1. ශ්‍රී ලංකාවේ යෞවන කටයුතු හා සෞඛ්‍ය අමාත්‍යාංශයන් (The Ministries of Youth and the Health in Sri Lanka) විසින් මුඛ සෞඛ්‍යය (Oral health), පෝෂණය (Nutrition) හා ලිංගික හා ප්‍රජනන සෞඛ්‍ය අවශ්‍යතා සපුරාලීම (Sexual and Reproductive Health Needs) සඳහා හඳුන්වා දී ඇති වැඩසටහන්වලට විශේෂ අවධානයක් යොමු කරමින් ඉටු කරන භූමිකාව පිළිබඳව සාකච්ඡා කරන්න.
(ල.15)

5.2. මානසික රෝග ජයග්‍රහණය කිරීම සඳහා හඳුන්වා දී ඇති වැඩසටහන්වලට විශේෂ අවධානයක් යොමු කරමින් ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ඉටු කරන භූමිකාව පිළිබඳව සාකච්ඡා කරන්න. (ල.10)

06. 6.1. අනාරක්ෂිත ගබ්සාවන්ට (Unsafe Abortion) හේතු වන සාධක සාකච්ඡා කරන්න.

(ල.12)

6.2. ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO) විසින් හඳුනාගෙන ඇති ක්‍රියාමාර්ග සඳහා ප්‍රමුඛතා පෝෂණ (Priority Nutrition) ක්ෂේත්‍ර හය පිළිබඳව සාකච්ඡා කරන්න.

(ල.13)

*************සියළුම හිමිකම් ඇවිරිණි*************